# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
තැ.පෙ. 1559, කොළඹ 0 1.

பொதுத் திறைசேரி, நிதி திட்டமிடல் அமைச்சு
த.பெ. இல 1559, கொழும்பு 01.

General Treasury, Ministry of Finance & Planning, P.O.Box: 1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094 112 484729, tod_dg@tod.treasury.gov.lk

ෆැක්ස් / தொலைநகல் / Fax: 0094 112 320042, 0094 112 484828

පොදු / பொது / General: 0094 112 484500, 0094 112 484600


මගේ අංකය / எனது இல / My No.: ටීඕඩී/ඩී/සීඑම්අයි /2010

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதි / Date: 2010.12. 08

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක :- 8/2010

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත.

<u>2011 වර්ශයේ අයවැය ඇස්තමේන්තු යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව වියදම් සඳහා අග්‍රිම සීමාවන් නියම කිරීම</u>

2011 වර්ශයේ අයවැය ඇස්තමේන්තු යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන පදනම් කර ගෙන අග්‍රිම සීමා අනුමත කිරීම කල යුතු බැවින්, ඒ සඳහා වන අයදුම් පත්‍ර ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/02 සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/03 2010.12.31 දින හෝ ඊට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතුය.

2. ඉහත ලියවිලි සකස් කිරීමේදී පහත සඳහන් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම් නිවැරදිව ගණනය කර අයවැය ප්‍රතිපාදන වලින් අඩුකර දැක්විය යුතුය.

2.1 පුනරාවර්තන වියදම් (පුද්ගල පඩිනඩි) සඳහා වූ අග්‍රිම සීමාව නිර්ණය කිරීමේ දී පහත සඳහන් ගැලපීම් සිදුකල යුතුය.

(i) වැ.අ.වි.වැ. වෙනුවෙන් වැටුප් හා වේතන සඳහා වූ ප්‍රතිපාදනයෙන් 6.5% ක්.

(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අවම බැර සීමාවට සමාන මුදලක්.

(iii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ ගෙවන ණය සඳහා පොලී අය කිරීම්.

2.2 වෙනත් අත්තිකාරම් ගිණුම යටතේ ඇතුලත් කෙරෙන මුදල පහත පරිදි ගණනය කල යුතුය.

| | |
|---|---|
| වෙනත් අත්තිකාරම් ගිණුම් යටතේ සම්පූර්ණ හර සීමාව | xxx |
| අඩුකලා : හරස් සටහන් මගින් ගිණුම්කරණ ලැබීම් | xxx |
| අවම ලැබීම් සීමාව | xxx |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අක්මුදල | xxx |

3. සමස්ථ අග්‍රිම සීමාව ගණන් බැලීම සඳහා පහත දැක්වෙන තොරතුරු ඉහත ලියවිලි සමග මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතු බව කාරුණිකව සලකන්න.

(i) ආදායම් සටහන් කිරීමේදී අනුමත ආදායම් ඇස්තමේන්තුවක් තිබේනම් එයද, එක් එක් මාසයේ දී ආදායම් වශයෙන් මුදලින් රැස් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන වටිනාකමද, ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/02 හි දක්වා ඇති පරිදි 10 වන තීරුවේ (2) වන කාණ්ඩය යටතේ සඳහන් කල යුතුය.


අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් ප්‍රවාහ සහ ඒකාබද්ධ අරමුදල් කළමණාකරණය )
Additional Director General (Cash Flows & Consolidated Funds Management)
Tel : 0094 112 484738
Fax : 0094 112 484852
gunathilakep@tod.treasury.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ණය සේවා සහ ගිණුම්)
Additional Director General (Debt. Servicing & Accounting)
Tel : 0094 112 484748
Fax : 0094 112 484828

අධ්‍යක්ෂ(අරමුදල් කළමණාකරණය )
Director ( Funds Management)
Tel: 0094 112 484971

අධ්‍යක්ෂ (ණය සේවා සහ ගිණුම්)
Director (Debt. Servicing & Accounting)
Tel: 0094 112 484750

අධ්‍යක්ෂ (ආදායම්)
Director (Revenue)
Tel : 0094 112 484711

(ii) වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ඔබ ආයතනය වෙනුවෙන් වූ ගෙවීම් සඳහා වෙන් කර දෙනු ලබන ප්‍රතිපාදන. (එසේ වෙන් කර දෙනු ලබන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ එම ප්‍රතිපාදන ලබා දෙන ආයතන පිළිබඳ විස්තර ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/04 අනුව ඉදිරිපත් කල යුතුය)

(iii) ඉහත 2.1 හි සඳහන් අයිතමයන්ට අමතරව අදාල කාලපරිච්ඡේදය සඳහා හරස් සටහන් මගින් ගිණුම් ගත කිරීමට අපේක්ෂා කරනු ලබන වෙනත් වියදම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර.

(iv) 2010 හෝ ඊට පෙර වර්ෂ වලදී තුන්වන පාර්ශවයන්ගෙන් පොදු තැන්පත් ගිණුම යටතේ රැස් කර ඇති මුදල් ඇතොත් ඒවා ආපසු ගෙවීම වෙනුවෙන් වූ මාසික මුදල් අවශ්‍යතාවයන් පිළිබඳ විස්තරයක්.

(v) භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 6/2010 හි 1.2 ඡේදය හා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 212/2010 හි 5.1 ඡේදයේ උපදෙස් අනුව ඉතිරි ප්‍රතිපාදන තැන්පත් ගිණුමට මාරු කිරීම් පිළිබඳ විස්තරයක්.

(vi) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ලද ප්‍රතිපාදන වල මුළු වටිනාකම.

(vii) යම්කිසි අමාත්‍යාංශයක්, භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා අග්‍රිම උපයෝගී කර ගෙන, එම අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අරමුදල් නිදහස් කරනු ලබන්නේ නම්, එවැනි අමාත්‍යාංශ, ඒ පිලිබඳ විස්තරයක්.

(viii) ඉහත ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ලද උපකල්පයන් සහ ගණනය කිරීම්

4. ඉහත (01) හා (03) ඡේද වල සඳහන් කර ඇති ආකෘති පත්‍ර දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත හැකිය (www.treasury.gov.lk) මෙම කරුණු සම්බන්ධව පැහැදිලි කිරීම් තවදුරටත් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා කරුණාකර පහත සඳහන් නිලධාරීන් අමතන්න.

| නිලධාරියාගේ නම හා තනතුර | අංශය | දුරකථන අංකය |
|---|---|---|
| ටී. නලීන් ඔෂන් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ජාතික ආරක්ෂාව, යුක්තිය පසඳලීම<br>සහ නීතිය බලාත්මක කිරීම | 2484739 |
| එස්. ඒ. එස්. වික්‍රමරත්න මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | යටිතල පහසුකම් සංවර්ධනය.<br>සමාජ ආරක්ෂණය, ජීවනෝපාය හා<br>ප්‍රාදේශිය සංවර්ධනය | 2484743 |
| එන්.පී. ධර්මරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | රාජ්‍ය පරිපාලනය,මෙහෙයුම් සහ නියාමනය | 2484744 |
| එම්.ජී. බී. එල්. මනෝහරී මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂිකා | මානව සම්පත් සංවර්ධනය, කලාව ආගම සහ<br>සංස්කෘතික කටයුතු, විද්‍යා හා තාක්ෂණය,<br>පර්යේෂණ හා සංවර්ධනය | 2484740 |
| කේ. එස්. දයාරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | නිෂ්පාදන , සේවා සහ පරිසරය | 2484742 |

දයානන්ද විදානගමාච්චි
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත :- 1. විගණකාධිපති,